# සම්ප්‍රදායික නර්තන සම්ප්‍රදායට හෙළ මියැසි රාවය ආරම්භයක් වූ වගයි !

**. . . . . ඉන් වසර තුනකට පසු පවත්වනු ලබන "හළ මියැසි රාවය සමඟ රාජාභිෂේක ෂෂ ප්‍රසංගයේ විශේෂත්වය පිළිබඳ අදහස් දක්වන උදුම්බරා.... "අපගේ රංගායතනයේ නර්තනය ප්‍රගුණ කරන සිසු සිසුවියන් සහභාගිවන මෙම විචිත්‍ර ප්‍රසංගය තුලින් තවත් එක් විවිධප්‍රසංගයකට වැඩි යමක් ඉදිරිපත් කරන්න මං බලාපොරොත්තු වෙනවා. මෙහි ප්‍රථම භාගය නැතිනම් "හෙළ මියැසි රාවය" ශ්‍රී ලාංකීය ජන සංගීතය පිළිබඳ විවිධ පර්යේෂණ කළ ඩබ්. බී. මකුලොලුව ප්‍රමුඛ සී. ද එස්. කුලතිලක, රෝහන බැද්දගේ, විරසේන ගුණතිලක, ලයනල් රන්වල, සමන් පනාපිටිය වැනි වියතුන් අපගේ ගම් දනව් සැරිසරා මහත් පරිශ්‍රමයකින් එකතු කරගන්නා ලද ජන කවි, ජන ගී හා ජන සැහැලි සමුච්චයක් කැටි කොට මගේ පියාණන් වූ 60 දශකයේ ප්‍රවීණ නාට්‍ය ශිල්පියෙකු වූ වේදිකා ප්‍රසංග යකට (Pageant) ගැලපෙන අයුරින් සැකසූ පිටපතක් උපයෝගී කරගනිමින් අප විසින් කරනු ලබන අත්හදා බැලීමක් ලෙසින් නම් කළ හැකිය. මෙහි අභිලාශය වන්නේ අප ආයතනයේ හදාරනු ලබන දරු දැරියනට ශ්‍රී ලාංකීය නිසග කලා අංගයන් හි ඇති වටිනාකම පිළිබඳ ප්‍රායෝගික අත්දැකිමක් ලබා දීමත් මෙල්බන්වාසී පළපුරුදු ප්‍රවීන කලාකරුවන් සමග සාමූහිකව වැඩකිරීමේ පරිචයක් ලබාදීමත්‍ය....." යනුවෙන් ප්‍රකාශ කළාය.**

උදුම්බරා සන්දීපනී කරුණාරත්න ඔස්ට්‍රේලියාවට පැමිණියේ නර්තන විෂයය පිළිබඳ පශ්චාත් උපාධි ශිෂ්‍යත්වයක් මතය. ඒ වනවිට කොට්ටාව ධර්මපාල විදුහලෙන් ප්‍රාථමික අධ්‍යාපනය ලබා කොළඹ දේවි බාලිකා විද්‍යාලයෙන් ද්විතීක අධ්‍යාපනය නිමකර සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලයේ නර්ථනය පිළිබඳ ප්‍රථම පෙල ලලිතකලාවේදී ගෞරව උපාධියක් ද ලබා කොළඹ සරසවියේ ප්‍රසාංගික කලා අංශයේ නර්තන විෂය පිළිබඳ කථිකාචාර්යවරියක ලෙස සේවය කරමින් සිටියාය.

සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ මුදියන්සේ දිසානායක, ආරියරත්න කළුආරච්චි, වික්‍රමසිංහ බණ්ඩාර, පියාසර ශිල්පාධිපති වැනි නර්තන විශාරද ආචාර්යවරුන් යටතේ උඩරට, පහතරට, සබරගමු යන ප්‍රධාන නර්තනාංග හරහා වූ විවිධ නර්තන ක්‍රමවේදයන් මැනවින් ප්‍රගුණ කළ උදුම්බරාවෝ මිරැන්ඩා හේමලතා ගුරුමෑණියන්ගෙන් භරත නාට්‍ය වසර හයක් පමණ හදාර 1996 දී එහි කලච්ළි මංගල්‍යය ටවර් රඟහලේ දී පවත්වන ලද්දේ විශ්ව විද්‍යාල ප්‍රවේශය සමත්ව සිටියදී ය. මේ අතර ඇය විසින් පවත්වාගෙන යනු ලැබූ සරසවි අමර නර්තන පුහුණු පාසලේ වසර නමයක් ශිල්ප හැදෑරූ ඇගේ ශිෂ්‍යාවකගේ භරත නාට්‍යම් කලච්ළි මංගල්‍යයක් පැවැත් වූ ප්‍රථම ලාබාල ගුරුවරිය වීමේ භාග්‍යයද ඇය ලැබුවාය.



සරසවි අධ්‍යාපනය ලබමින් සිටි අවධියේ දී ඇය ශ්‍රී ලංකා සංස්කෘතික දෙපාර්තමේන්තුවට අනුබද්ධ රාජ්‍ය නර්තන කණ්ඩායමේ සාමාජිකාවක් වශයෙන් කටයුතු කරමින් ජන සංගීත හා නර්තනය පිළිබඳ පර්යේෂණ රාශියක් කළ සී. ද. එස්. කුලතිලක සංගීතවේදියාණන් ගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගර කිහිපයකම නර්තන ප්‍රසංග පවත්වා ඇත. ඊට අතිරේකව විශ්ව විද්‍යාල ආචාර්යවරුන් සමඟ විදේශ නර්තන උළෙල කිහිපයකට ද ඇය සහභාගි වී ඇත. අත්දැකීම් ලබා ඇත්තීය. එමෙන්ම ඉන්දියාවේ ලක්නව් හි භාත්කණ්ඩේ සංගීත හා නර්තන විශ්ව විද්‍යාලයේ භරත නාට්‍ය සිව් අවුරුදු පාඨමාලාවේ ප්‍රථම පෙළ සාමාර්ථයක් ද ලබා නර්තන ආචාර්ය වරියකට කලාතුරකින් ලැබෙන නෘත්‍ය විශාරද උපාධි සහතිකය ද ලබා ගැනීමට ඇය සමත් වූවාය.

රංගන උදුම්බරා යුවල සිය වෘත්තීය සේවාවන්ට අමතරව මෙල්බන් හි ශ්‍රී ලාංකික සිසු සිසුවියන් සියයකට අධික පිරිසකට ශාස්ත්‍රීය උඩරට පහතරට හා සබරග මු මෙන්ම දකුණු ඉන්දීය භරත නැටුම්ද නිර්මාණාත්මක නර්තනය ද ඉගැන්වීමේ වැඩමුළු ඩැන්ඩිනොන්, මවුන්ට් මෙවලි හා එයාපෝට් වෙස්ට් යන ප්‍රදේශයන්හි පවත්වගෙන යනු ලබයි. මෙම පුහුණු වැඩමුළු හා ඔස්ට්‍රේලියානු ප්‍රාන්ත රාජ්‍යයන් හි මෙන්ම මෙල්බන් පලාත් පාලන ආයතන විසින් වසරක් පාසා සංවිධානය කරනු ලබන නර්තන උත්සව හා පොදු පුහුණු වැඩමුළු සෑමතැනකම සහභාගි වී ඇති රංගන උදුම්බරා නර්තන කණ්ඩායම පිළිබඳව නොදන්නා කලාකරුවකු රසිකයකු වේ නම් එය අරුමයක් ලෙසින් හැඳින්විය හැකිය. පසුගිය වසරේ මෙම නර්තන කණ්ඩායම ප්‍රථම වරට මෙල්බන් හි පවත්වන ලද ඔස්ට්‍රේලියානු නර්තන සම්මාන උළෙලේදී තෝරා ගත් නර්තන කණ්ඩායම් පහට ඇතුළත් වීම, ප්‍රථම වරට ශ්‍රී ලාංකීය නර්තන කණ්ඩායමක් ලද ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකිය.

රංගන - උදුම්බරා නර්තන කණ්ඩායමේ මංගල නර්තන ප්‍රසංගය වූ රාජාභිෂේක I 2006 අප්‍රේල් මාසයේ ඇලෙක්සැන්ඩර් රංග ශාලාවේදී පවත්වන්නට යෙදුනි. ඉන් වසර තුනකට පසු පවත්වනු ලබන "හළ මියැසි රාවය සමඟ රාජාභිෂේක II ප්‍රසංග යේ විශේෂත්වය පිළිබඳ අදහස් දක්වන උදුම්බරා.... "අපගේ රංගායතනයේ නර්තනය ප්‍රගුණ කරන සිසු සිසුවියන් සහභාගිවන මෙම විචිත්‍ර ප්‍රසංගය තුලින් තවත් එක් විවිධප්‍රසංග යකට වැඩි යමක් ඉදිරිපත් කරන්න මං බලාපොරොත්තු වෙනවා. මෙහි ප්‍රථම භාගය නැතිනම් "හෙළ මියැසි රාවය" ශ්‍රී ලාංකීය ජන සංගීතය පිළිබඳ විවිධ පර්යේෂණ කළ ඩබ්. බී. මකුලොලුව ප්‍රමුඛ සී. ද එස්. කුලතිලක, රෝහන බැද්දගේ, විරසේන ගුණතිලක, ලයනල් රන්වල, සමන් පනාපිටිය වැනි වියතුන් අපගේ ගම් දනව් සැරිසරා මහත් පරිශ්‍රමයකින් එකතු කරගන්නා ලද ජන කවි, ජන ගී හා ජන සැහැලි සමුච්චයක් කැටි කොට මගේ පියාණන් වූ 60 දශකයේ ප්‍රවීණ නාට්‍ය ශිල්පියෙකු වූ වේදිකා ප්‍රසංග යකට (Pageant) ගැලපෙන අයුරින් සැකසූ පිටපතක් උපයෝගී කරගනිමින් අප විසින් කරනු ලබන අත්හදා බැලීමක් ලෙසින් නම් කළ හැකිය. මෙහි අභිලාශය වන්නේ අප ආයතනයේ හදාරනු ලබන දරු දැරියනට ශ්‍රී ලාංකීය නිසග කලා අංගයන් හි ඇති වටිනාකම පිළිබඳ ප්‍රායෝගික අත්දැකිමක් ලබා දීමත් මෙල්බන්වාසී පළපුරුදු ප්‍රවීන කලාකරුවන් සමග සාමූහිකව වැඩකිරීමේ පරිචයක් ලබාදීමත්‍ය....." යනුවෙන් ප්‍රකාශ කළාය.

ජූලි 25 වැනි සෙනසුරාදා සවස 6 ට බර්වුඩ් බීසන් සෙන්ටර් රඟහලේ දී වේදිකා ගතවන මෙම ප්‍රසංගයේ මුලකොටස වූ "හෙළ මියැසි රාවය" නෘත්‍ය ප්‍රසංගයේ නාට්‍යමය අවස්තාවන් අධ්‍යක්ෂණය එස්. කරුණාරත්න සහ ජයශ්‍රීචන්ද්‍රජිත් ගෙනි. සජීවී සංගීත සංයෝජනය සංගීත වේදී තරුපති මුණසිංහ විසින් සපයනු ලබන අතර රංගනයෙන් හා ගායනයෙන් දායක වන්නේ සෙව්වන්දිකා අබේරත්න, හිරණ්‍යා මනෝරත්න, මිලන්කා චන්ද්‍රජිත්, නලිනි දේවේන්ද්‍ර, ගයානි මුණසිංහ, සහ රෝහණ කරුණාරත්න, හේමන්ත ඩයස්, භානුක මනෝරත්න, මන්ජිත් චන්ද්‍රජිත්, සුදේශ් ගොඩහේන දයා ප්‍රනාන්දු යන කලා ශිල්පීන්ය. ප්‍රසංගයේ දෙවන භාගය වූ රංගාභිෂේක II , දේශීය ශාස්ත්‍රීය හා ගැමි නැටුම් වලින් විචිත්‍රවත් වන අතර පහතරට දුම්මල පදය, සබරගමු පතුරු හා චාමර නැටුම් වැනි දුර්ලභ ගනයේ නැටුම් ද නිර්මාණාත්මක අයුරින් ප්‍රේක්ෂක උසස් රසවින්දනය සඳහා ඉදිරිපත් කරනු ඇත. රංගන-උදුම්බරා නර්තන කණ්ඩායමේ නිශ්පාදනයක් වන මෙම ප්‍රසංගයේ රංගන වින්‍යාසය උදුම්බරා හා රංගන රත්නතුංගගෙනි.

හෙළ මියැසි රාවය සමග රංගාභිෂේක II ප්‍රසංගය පුරා රංගනයෙන් හා අනෙකුත් කාර්යයන්හි නියැලි රංගන උදුම්බරා නර්තන කණ්ඩායමේ සියයට අධික සිසු සිසුවියන් ද ප්‍රසංගයේ සාර්ථකත්වය උදෙසා නන් අයුරින් උරදී කටයුතු කරන එම දරු දැරිවියන්ගේ දෙමාපිය ඥාති පිරිසටද ගෞරව පූර්වක ස්තූතිය පුදකර සිටින බව රංගන උදුම්බරා යුවල අවසාන වශයෙන් ප්‍රකාශ කර සිටිති.

එස්. කරුණාරත්න